# සුළු රබර් ඉඩම් හිමියන්ගේ සංවිධාන ඒකාබද්ධ සංවර්ධන ප්‍රවේශය හා එහි කාර්ය භාරය

යූ. එල්. ආර්.ඒ. පෙරේරා

## හැඳින්වීම

සුළු රබර ඉඩම් හිමියන්ගේ ප්‍රාථමික සංවිධාන (සමිති) අවධානයට යොමුවී ඇත. එවන් සංවිධාන විසින් රබර වගා කරන ප්‍රදේශ වල ජනතාවට කිසියම් සැලකිය යුතු සේවාවන් ඉටු කරනු ලබයි. සුළු ඉඩම් හිමියන් එම සංවිධාන වලින් ප්‍රතිලාභ ලබාගැනිමට පුරුදු පුහුණු වී ඇත. ප්‍රාථමික සමිති ඒකරාශී වීමෙන් දිස්ත්‍රික් රබර සංගමයක් ද පිහිටුවාගෙන ඇත. තවත් එවන් සංවිධාන ඉදිරියේදී ඒ අනුව ඇතිවනු ඇත.

මෙවැනි ප්‍රාථමික සංවිධාන වල ක්‍රියාකාරිත්වය පිළිබඳව පසුගිය දස වසර තුල විවිධ අත්දැකීම් ලබා ඇත. ඒ අනුව එම සංවිධාන ක්‍රියාත්මක විය යුත්තේ කෙසේදැයි නිශ්චිතව හඳුනා ගැනිමට හැකිවී ඇත. මෙම සංවිධාන මුල් අවස්ථාවේ රබර නිෂ්පාදනයට. රබර කිරි අලෙවියට පමණක් සීමාවී තිබු ඒවා විය. නව පරිවර්තනයත් සමඟම රබර නිෂ්පාදනයට අලෙවියට පමණක් නොව සාමාජිකයන්ගේ සමාජ ආර්ථික හා මානවීය සංවර්ධනයට උර දෙන ආයතන ස්වරූපයක් ගනිමින් ඒවා සංවර්ධනය වී ඇත. ඉඩම් හිමි සාමාජිකයා හසුවී සිටින අනවබෝධය. බලයක් නොමැති කම. නිතර ණය ගැතිකම. ආපදා වලක්වාලීම වැනි කටයුතු වලදී අවශ්‍යතා මැනවින් හඳුනාගත් පූර්ණ කාලපවත්නා සංවර්ධනයක් කරා යොමු කිරීමට මාර්ගයක් සකස්වී ඇත.

එවැනි ග්‍රාමීය මානවීය සංවර්ධන ප්‍රවේශයක් කරා යොමු කිරීමට කටයුතු යොදන ආකාරය මේ ලිපිය මගින් විස්තර කෙරේ.

### 1. සුළු රබර් ඉඩම් හිමියාට බලපාන හඳුනාගෙන ඇති ගැටළු:

i. වසර හයක් පමණ වන දිගු. නොමේරූ කාලයක් ආදායමක් නොමැති වීම (අතුරු බෝගයක් නොමැති විට)

ii. වැස්ස . දේශගුණික හේතු නිසා ආදායමක් ලබාගැනීමට නොහැකිවීම.

iii. ආදායම් ලබාගත හැකි දින ගණන සීමාවීම

iv. රබර වගාවේ යෙදවුම් පැල. පොහොර. රෝග මර්දන රසායන සපයාගැනිමට අපහසුවීම.

v. රබර් කිරි සකස් කිරීම, ඇලුමිනියම් තැටි, පෙරණ දැල්, රසායනික ද්‍රව්‍ය (අම්ල, සෝඩියම්) රෝල, දුම් ගෙවල ආදී, පහසුකම් අඩුවීම.

vi. පුහුණු කිරි කැපුම් කරුවන් සපයා ගැනීමට නොහැකිවීම.

vii. නිෂ්පාදන වෙළඳපොලේ ඉහලම මිලට අලෙවි කර ගැනීමට නොහැකිවීම.

## 2. සුළු රබර් ඉඩම් හිමියන් සඳහා රබර් නැවත වගා සහනාධාර

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ආධාර ලබාදීම සිදු කරයි. එම ආධාර මඟින් ඉඩම් සකස් කර ගැනීම

- උසස් වර්ගයේ රබර් පැළ ලබාදීම
- පොහොර ලබාදීම
- තාක්ෂණික දැනුම ව්‍යාප්ති සේවාව මඟින් ලබාදීම

ආදියෙන් සුළු ඉඩම් හිමියනට සහනයක් සිදුවී ඇත. එම වැයවන මුළු වියදමින් සැලකිය යුතු ප්‍රතිශතයක් සහනාධාර වශයෙන් ලැබේ.

## 3. සුළු රබර් ඉඩම් හිමියන් සඳහා ව්‍යාප්ති සේවාව:

පහත සඳහන් කාර්යයන් ව්‍යාප්ති සේවාව මඟින් ඉටු කරනු ලබයි. මෙහිදී ව්‍යාප්ති නිලධාරි මහතා, විපර්යය කාරකයෙක් වශයෙන් ක්‍රියාකරන අතර, විවිධ සම්ප්‍රදායයන් වල, මානසික තත්ත්වයන් යටතේ රබර් වගාවේ යෙදෙන ගොවීන්ගේ ආකල්පමය වෙනසක්ද ක්‍රියාකාරිත්වයේ වෙනසක්ද, හුරුවේ වෙනසක් ද ඇති කිරීමටද එම ව්‍යාපති සේවාවෙන් උත්සාහ කෙරේ.

පහත සඳහන් කාර්යයන්:

1. රබර් වගාව සඳහා ඉඩම් සකස් කිරීම
2. පැළ සිටුවීම, රෝග මර්දනය පිළිබඳ තාක්ෂණය
3. කිරි කැපීම සඳහා ගස් සලකුණු කිරීමේ පුහුණුව ලබාදීම
4. ආධාර මුදල් නිකුත් කිරීම නිර්දේශ කිරීම
5. රබර් කිරි, රබර් ෂීට්, දුම් ගෙවල නිෂ්පාදනය පිළිබඳ තාක්ෂණය
6. අලෙවියට අදාළ මඟ පෙන්වීම

සඳහා ව්‍යාප්ති සේවාව ඉඩම් හිමියාට සහයෝගයක් ලබා දෙයි.

## 4. ව්‍යාප්ති සේවාවේ විපර්යකාරක ප්‍රවේශය, සංවිධානයක් සඳහා සුළු ඉඩම් හිමියන් අභිප්‍රේරණාය කිරීම

යථෝක්ත 3 කාරයයෙහි යෙදෙන ව්‍යාප්ති සේවාව ඉඩම් හිමියාගේ ආකල්පමය වෙනසක් ඇති කිරීම සඳහා මැදිහත් වන්නෙකි. එම සේවාව සාමූහික කාරයයේදී ඔවුන් ධෛර්යමත් කිරීමත්, එකරාශී කර ඔවුන් තුළ සිටින අනවබෝධය දුරු කර ලීමට උපකාර කිරීමත්, වැඩිමනත් ඉඩම් හිමියන් සංවිධාන ව්‍යුහයකට ගොනු කිරීම සඳහා යොමු කිරීමත් ව්‍යාප්ති සේවාවේ ප්‍රධාන අරමුණ වේ. තවද නිෂ්පාදනයන් සඳහා උපරිම මිලක් ලබා දීමට මැදිහත් වීමක් සිදුවිය යුත්තකි. එම සේවාව ලබාදීමත්, සේවාව ලබා ගැනීමටත්, දෙපාර්ශවයම උත්සාහ ගත යුතුව ඇත.

## 5. රබර් ඉඩම් හිමියන්ගේ සංවිධානයක් තුල සංවිධිත ප්‍රයත්නය සඳහා ප්‍රායෝගික මනෝ විද්‍යාත්මක මුල ධර්මය:

මෙම මුල ධර්මය ව්‍යාප්ති කාරයයේ මුල ධර්ම වශයෙන්ද හැඳින්වුවාට වරදක් නැත. මෙහිදී කණ්ඩායමක් එකරාශිවීමෙන් මතු වන්නාවූ සුවිශේෂ තත්ත්වයක් වශයෙන් පෙන්වා දිය හැක. එනම් පරිපූර්ණ ඒකාග්‍රතාවයෙන් සිත් දෙකක් හෝ සිත් දෙකකට වැඩි ගණනක් සංකලනයවූ විට එසේ සංකලනයවූ සිත ඇති පුද්ගලයින්ට උත්තර මානුෂික වික්‍රමයන්හි යෙදෙන්නට හැකිවනසේ එතරම් රසායන මුල ධර්මය වර්ධනය කරගත හැකිය. කෙබඳු කාරයයක දී වුවත් මිනිසා සාර්ථකත්වයට පත් කරන ශක්තිය නම් බලයයි. තමන්ගේ සිත් පරිපූර්ණ ඒකාග්‍රතාවයකට පමුණුවා ගෙන තම පෞරුෂයත්, තම පෞද්ගලික අපේක්ෂාවනුත්, අනුහුරු කැර ගැනුමේ ශ්‍රද්ධානයක් ඇති මිනිසුන් හා ගැහැණුන් කණ්ඩායමකට සීමා රහිත ප්‍රමාණයකින් බලය භුක්ති විඳින්නට හැකිය. මෙහිදී ඒකාග්‍රතාවය යන වචනය ගැන විමසිලිමත් වීම ඵලදායකය. පරිපූර්ණ ඒකාග්‍රතා මාත්‍රයක් නැති තැන බලය, ශක්තිය, (සුපිරි මනසක්) වර්ධනය විය නොහැකිය. පරිපූර්ණ ඒකාග්‍ර මනසක් ඇති කර ගැනීමේ අරමුණ ඇතිව කැළී ගැන්වුණු හා උණුසුම් වුණු සිත් ඇතොත් මිස එසේ නොවුන හොත් කේවල සිතක එකක, තවත් කේවල සිතක එකක සමඟ සංකලනය නොවෙයි. සිත් දෙකක් අරමුණු අතින් මාරග දෙකක ගමන් ගන්නා මෙහොතේ සමඟි සම්පන්න තත්ත්වයක් ඇති වුවත්, සුපිරි තත්ත්වයක් සුපිරි මනසක් වන තන්වන වස්තු මාත්‍රය කැඩී බිඳී යයි.

ඉහත සඳහන් කල මූල ධර්මය සුළු ඉඩම් හිමියන් තමන්ගේ සංවිධානයට ගලපා ගතයුතුව ඇත. එම කණ්ඩායම් ඒකාග්‍රතාවයෙන් සිත් ඒකරාශීවීමෙන් මතු වන්නාවූ බලය වැඩට යොදා ගැනීමට හැකිවනු ඇත.

(බංගලි දේශයේ ග්‍රාමීන් වැඩසටහන. ශ්‍රී ලංකාවේ ජනශක්ති කාන්තා වැඩ සටහන. ඉන්දියාවේ අමුල් එළකිරි හා වර්ණ උක් සමුපකාර ව්‍යාපාරත් උදාහරණ වශයෙන් දක්විය හැකිය.)

## 6. පුද්ගලයෙක්/සංවිධානයක් සාර්ථකත්වයට පත්වීම සඳහා බලපාන සාධන:

සංවිධානයක සාර්ථකත්වයට පත්වීමට නම් සාර්ථකත්වය අත්දකින ලද පුද්ගලයන්ගෙන් එය සමන්විත විය යුතුය. සාර්ථක පුද්ගලයන් ගෙන් සමන්විත කණ්ඩායමකට සාර්ථක සංවිධානයක් බිහි කිරීම පහසු කාර්යයකි.

***සාර්ථකත්වයට බලපාන සාධක: (පුද්ගල සංවිධානයක)***

1. නිශ්චිත අරමුණක්
2. ආත්ම විශ්වාසය
3. ඉතිරි කිරීමේ පුරුද්ද
4. පුරෝගාමී නායකත්වය
5. කල්පනා ශක්තිය
6. උද්‍යෝගය
7. ආත්ම දමනය
8. ලැබෙන ප්‍රතිලාභය (දෙය) ට වඩා වැඩියෙන් වැඩ කිරීම
9. ප්‍රිය ශීලි පෞරුෂය
10. නිරවද්‍ය චින්තනය
11. චිත්ත ඒකාග්‍රතාවය
12. සහයෝගය
13. පරාජයෙන් ප්‍රයෝජන ගැනීම
14. අනුන්ගේ මත ඉවසීම
15. මධ්‍යම ප්‍රතිපදාව ක්‍රියාත්මක කිරීම

මෙම මූල ධර්ම මැනවින් හදාරා ඒවා තමන්ගේම දේ බවට පත් කර ගැනීම ප්‍රයෝජනවත් උත්සාහයක් වනු ඇත.

**7. කුඩා රබර් ඉඩම් හිමියන්ගේ සමුපකාර සමිති සංවිධානයක තිබිය යුතු නිශ්චිත අරමුණු:**

ග්‍රාම්‍ය මට්ටමේ සංවිධානය එයයි. අදාල බල ප්‍රදේශයේ රබර් ඉඩම් හිමියන්ගෙන් එය සමන්විත විය යුතුය. ඉඩම් හිමියන්ගේ සමාජ ආර්ථික මානව සංවර්ධනයට අවශ්‍ය සියළුම අවශ්‍යතා සාමුහිකව ලභා කර ගැනීම මෙහි මුලික අරමුණ වෙයි.

එම කාරය සපුරා ගැනීමට.

1. සාමාජික කොටස්. ඉතිරි කිරීම් මඟින් අරමුදල් වර්ධනයද.
2. සාමාජික නිෂ්පාදන සඳහා උපරිම මිලක් ලබාදිම
3. සාමාජිකයන් සඳහා ණය අත්තිකාරම් සැපයීම
4. සාමාජිකයන්ගේ ඉඩම් සංවර්ධනයට අවශ්‍ය යෙදවුම් ලබාදිම
5. සාමාජිකයන්ට ආදායම් රහිත කාලවල මුල්‍ය පහසුකම් ලබාදිම
6. සමාජ ආර්ථික සංවර්ධනය සඳහා තෝරාගත් ව්‍යාපෘති වලට මුල්‍ය ආධාර ලබාදීම
7. මානවීය සංවර්ධනයට අදාල කටයුතු

**8. සංවිධාන සැලැස්ම (රබර් සමුපකාර සමිති/සංගම්) :**

රබර් ඉඩම් හිමියන්ගේ සමුපකාර සමිති ව්‍යාපාරය තුල මැනවින් ක්‍රියාත්මක වන සංවිධාන සැලැස්මක් තිබීම අත්‍යවශ්‍යය කාරයයක් විය යුතුය.

1. ඉලක්ක කොටගත් සුළු රබර් ඉඩම් හිමියන්ගේ පුර්ණ සහභාගිත්වය
2. සාමාජික සමිතිවල සාමාජිකයන්ගේ දියුණුවට ඇති බාධා ගැටළු වලට සංවිධානාත්මකව හා සාමුහිකව විසඳුම් ලබාදීමට ඉඩකඩ සැලැස්වීම
3. ඉලක්ක කොට ගත් පිරිසෙන් ප්‍රජා නායකයින් හා වගකීම් දරන්නන්. නිරන්තර හමුවීම. අදහස් හුවමාරුව. වැඩසටහන් පොෂණය කිරීමට ඉඩකඩ සැලැස්වීම.
4. නවීන තාක්ෂණය හා කළමණාකරණය. ශිල්ප ක්‍රම ගලපා ගත හැකි ආර්ථික ඒකකයන් මතු කිරම
5. සමිති/සංගම් වැඩ සටහනේ ස්වයං පැවැත්ම.
6. එළඹෙන තත්ත්වයන්ට. වෙනසකම් වලට උචිත ලෙස මුහුණ දී ක්‍රියාත්මක වීමේ හැකියාව.

7. කල්පවත්නා සංවර්ධනයක් සුළු රබර් ඉඩම් හිමියන් අතරට ගෙන යා හැකි ව්‍යුහයක් ඇති කිරීම.

**9. සංවිධානයේ තොරතුරු හා සාමාජික අවශ්‍යතා සොයා බැලීමේ සමීක්ෂණය:**

සාමාජික ඉඩම් හිමියන්ගේ අවශ්‍යතා මැනවින් හඳුනා ගැනීම ඉතා වැදගත් වනු ඇත. එම අවශ්‍යතා ඉටු කිරීම සඳහා ප්‍රමුඛතාවය ලැබෙන අයුරින් කටයුතු කළයුතුය. ඒ සඳහා සාමාජිකයන්ගේ තොරතුරු එක් රැස්කර ලේඛනගත කර තිබීම ඉතා වැදගත් වනු ඇත.

රබර් සමිතියේ බල ප්‍රදේශයේ සියළුම ඉඩම් හිමියන්ගේ පහත සඳහන් තොරතුරු සියල්ලම සමිතිය සතු විය යුතුය.

1. සාමාජික ඉඩම් හිමියාගේ නම සහ ලිපිනය

2. රබර් වගා කළ බිම් ප්‍රමාණය | මේරූ වගාව | නොමේරූ වගාව

   වගාවේ වයසය | ......................... | ..........................

3. දැනට ඇති රබර් සකස් කිරීමේ පහසුකම්:

   දුම් ගෙයක්/රෝල් යුවලක් තිබේද?

4. වෙනත් වගාවන්: | තේ | පොල් | කුරුඳු | කුඹුරු

   | ...... | ......... | ........... | ..........

5. පවුලේ තොරතුරු:

   බිරිඳ

   නම්

   දරුවන් 1.

   2.

   3.

   අධ්‍යාපන තත්ත්වයන් 1.

   2.

   3.

   හැකියා/කුසලතා

6. වගාවන් සඳහා ඒ ඒ කන්න වලට අවශ්‍ය යෙදවුම්:

රබර් පොහොර, කුඹුරු පෙහොර, වෙනත් පොහොර උපකරණ

7. රසායනික ද්‍රව්‍යය/දිලීර නාශක

8. රබර් නිෂ්පාදනය මාසිකව

9. සාමාජිකයන්ගේ වෙනත් මූල්‍ය ගැටළු, ණය ගැති භාවය

මානවීය අවශ්‍යතාව

යථෝක්ත තොරතුරු ලබාගැනීමෙන් අනතුරුව එම තොරතුරු ලේඛනගත කොට සාරාංශයක් පිළියෙල කළ යුතුව ඇත. සමීක්ෂණය ස්වේච්ඡා කණ්ඩායමක් මඟින් කිරීමට සංවිධානය කටයුතු කළ යුතුය.

ඉහත තොරතුරු සමීක්ෂණය පදනම් කරගෙන සංවිධානය සඳහා සංවර්ධන සැලැස්මක් සකස් කරගත යුතුව ඇත. මෙහිදී සාමාජික ගැටළුවලට සාමූහික විසඳුම් ලබාදීමට අවස්ථාව සලසා දිය යුතුය. යථෝක්ත (5) මූල ධර්මය ඇසුරෙන් ඒකාග්‍රතාවයකින් තම අදහස් ප්‍රකාශ කළ යුතුය. පොදු ඒකඟතාවයකට පැමිණි අදහස් ක්‍රියාත්මක කිරීම සංවිධානයේ නායකත්වයේ වගකීම වනු ඇත. මෙහිදී සංවිධානයේ ක්‍රියාකාරී කමිටුව සාමාජිකයනට වගකිව යුතුව ඇත. තීරණ ගැනීම තීරණ ක්‍රියාත්මක කිරීම, ප්‍රතිලාභ භුක්ති විඳීම, පසු විපරම් කිරීම, ඇගයීම ආදිය ඔවුන් විසින්ම කළ යුතුය. මෙහිදී නිලධාරීන්ගෙන් සිදුවිය යුත්තේ මඟ පෙන්වීම පමණි.

**10. අංක (7) න් සඳහන් කළ නිශ්චිත අරමුණු තව දුරටත් විග්‍රහ කිරීම:**

ඉඩම් සංවර්ධනය (රබර්, වෙනත්)

මේ යටතේ සාමාජිකයන්ගේ

1. රබර් වගාව, නැවත/අළුත් වගාකිරීම සොයා බැලීම, ලියාපදිංචි නොවූ ඉඩම් පිළිබඳ කටයුතු
2. රබර් ඉඩම් වෙනත් ඉඩම් වල පස සංරක්ෂණ කටයුතු, පොහොර යෙදීමේ කටයුතු
3. උපරිම ආදායම් ලබාගැනීමට හැකිවන පරිදි අතුරු බෝග, සත්ව පාලනය ගැන අවධානය යොමු කිරීම

4. ඒ සම්බන්ධයෙන් උපකාර ලබාගත හැකි ආයතන දෙපාරතමේන්තු ගැන අවධානය යොමු කිරීම.

5. රබර් සංවර්ධන නිලධාරී මඟින් අවශ්‍ය මඟ පෙන්වීම හා උපදෙස් ලබා දීම.

යන කරුණු මඟින් සාමාජිකයන්ගේ ඉඩම් සංවර්ධනය කිරීමට සංවිධානය කටයුතු කළ යුතුය.

රබර් ෂීට් රබර් කිරි අලෙවිය හා නිෂ්පාදන කටයුතු:

1. රබර් සමිතිය සතුව ඇති සැකසුම් මධ්‍යස්ථානයක් ඇත්නම්, එයින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම, එහි ධාරිතාවයට සරිලන රබර් ලබා ගැනීම.
2. සාමාජිකයන්ගේ ෂීට් රබර්, අමු කිරි ලබාගෙන ඒවා සාමූහිකව අලෙවි කර දීම.
3. සාමාජිකයන් සඳහා අත්තිකාරම්/මූල්‍ය ආධාර සපයා දීම.
4. උසස් තත්ත්වයේ නිෂ්පාදන කිරීම සඳහා කටයුතු
5. උපරිම මිලක් ලබා දීම සඳහා කටයුතු කිරීම.
6. රබර් වගාවෙන් ආදායම ලබන සියළුම ඉඩම් හිමියන්ට ප්‍රතිලාභ අත්වන පරිදි කටයුතු කිරීම.

***ආදායම් රහිත කාලවල සාමාජිකයන් වෙත මූල්‍ය ආධාර සැපයීම, සැකසුරුවම් ණය ගණුදෙනු කටයුතු:***

සමිතියේ සාමාජිකත්වය සඳහා මූල්‍ය පහසුකම් ලබාදීම අනිවාර්ය වගකීමකි. සහනාධාර මානසිකත්වයෙන් සිටින අපේ ගොවියා එම සංස්කෘතිය ණය සංස්කෘතියක් බවට වෙනස් කිරීම වැදගත් වෙයි. ස්වශක්තිය පිළිබඳව ඇති අවබෝධය පදනම් කරගෙන සාමාජිකයන් විසින්ම අරමුදලක් සංවර්ධනය කළ යුතුව ඇත. මෙම අරමුදල් සංවර්ධනය කරන ආකාරය පහත අරමුදල් සංවර්ධනය යටතේ සඳහන් වේ.

***සුළු රබර් ඉඩම් හිමියාගේ ග්‍රාමීය ඒකාබද්ධ සංවර්ධනය:***

ග්‍රාමීය සංවර්ධනය භෞතික හා මානවීය ඒකාබද්ධ සංවර්ධන ප්‍රවේශයක් ගත යුත්තකි. එය එක් අංශයකින් පමණක් නොව මානව සංවර්ධනයට අදාල සෑම අංශයකින්ම විය යුතු පළල් සංවර්ධනයකි. ඒකාබද්ධ සංවර්ධනයේදී සාමාජිකයාගේ පවුලේ ප්‍රශ්න හඳුනාගෙන ඒවාට පිළියම්

යෙදීම මඟින් භෞතික අවශ්‍යතාවයන්, අනෙක් පැත්තෙන් මානසික අවශ්‍යතා සැපිරීමක් සිදුවිය යුතුය. ඒකාබද්ධ සංවර්ධනය යනු පූර්ණ සංවර්ධන තත්ත්වයට ළඟාවීමකි. වඩා වැදගත් වන්නේ ඉලක්කය පිරිමසන සුළු රබර් ඉඩම් හිමියන්ගේ සක්‍රිය සහභාගිත්වය මත කරන සම්බන්ධතා ජාලයක් හා ආයතනික ව්‍යුහයක් මතුකර ගැනීමයි. නිරන්තරව ඉඩම් හිමියන් අවදි කර ලීමක් දැනුවත් භාවය ඔවුන් තුල ජනනය කිරීමත් හැකි වටපිටාවක් නිර්මාණය විය යුතුය.

රබර් ඉඩම් හිමියන් සඳහා තම ප්‍රාථමික සමිතියක්, අනෙක් කටයුතු සොයා බලන මව් සංගමයක් තිබීම දැනට මේ කාර්යය සඳහා උපකාරයක් වී ඇත.

අනවබෝධය, නුගත්කම, ආදායම් උපරිමයට ලබා ගැනීමේ නොහැකියාව, ණය ගැති බැවින් යුත් ඉඩම් හිමියන් අඛණ්ඩ හා ශක්තිමත් ආදායම් මාර්ගයක් ඇති කිරීමට ඉවහල වන්නාවූ ඉතිරි කිරීමට ණය පහසුකම් ලබාගැනීමට හැකි නැඹුරුවක් ඇති කිරීමට රබර් සමුපකාර සමිති සංගම් ක්‍රමය උත්සාහ කරයි.

## 11. අරමුදල් සංවර්ධනය

සංවිධානයක් සඳහා අරමුදල් ඇති කිරීම ඉතා වැදගත් කාර්යයකි. සංවිධානය අරමුදල් සංවර්ධනය කිරීමට නිශ්චිත වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. එම අරමුදල් මනා කළමණාකරනයකින් පවත්වාගෙන යෑම ද ඉතා වැදගත්ය.

අරමුදල් සංවර්ධනය පහත සඳහන් අයුරින් සිදුවේ.

1. කොටස් ප්‍රාග්ධනය
2. අනිවාර්ය ඉතිරි කිරීම්
3. සාමාජික තැන්පත්/සාමාජික නොවන තැන්පත්
4. සුරැකුම් පත්
5. ස්ථාවර තැන්පත්
6. ළමා ඉතිරි කිරීම්
7. වෙනත් ආයතන සංවිධාන වලින් ලැබෙන ප්‍රදානයන්

සාමාජකත්වය ඉතිරි කිරීමේ පුරුද්ද දියුණු කිරීම සඳහා කටයුතු කළ යුතුය. එවා විශ්වාසනීය මට්ටමින් ඉටු කිරීමත්, ලදු පත් නිකුත් කිරීම, පාස පොතක් ලබාදීම අනිවාර්ය කටයුත්තක් වේ.

**කොටස්:**

සාමාජිකයන් කොටස් මිලදී ගැනීම සාමාජිකත්වය සනාථ වීමකි. ඵලදායක කොටස් ප්‍රමාණයක් මිලදී ගැනීම සංවිධානයේ ප්‍රාග්ධනය වර්ධනයට මහත් සහනයකි. අවම වශයෙන් රු.100/- යේ කොටස් දහයක් මාස 6 ක් තුළදී ලබා ගැනීමට සාමාජිකත්වය සජීවීකරණය කළ යුතුව ඇත. එය සංවිධානයේ ව්‍යාපාරකරණයට මහත් සහනයක් වේ.

***අනිවාර්ය තැන්පත්:***

සෑම සාමාජිකයෙක්ම අනිවාර්ය ඉතුරු කිරීම් මගින් සමිතියේ මුදල් වර්ධනයට දායක කරගත යුතුය. කාරක නීති මගින් එය නීතිගත කර ගත යුතුය. එම ඉතුරුම් සඳහා පොලියක් ලබා දිය යුතු අතර, එම ඉතුරුම් ඇපයට තබා ඕනෑම විටක ණය ලබා ගැනීම සාමාජිකයාට අවස්ථාව සැලසිය යුතුය. සංවිධානය මගින් රබර් හා වෙනත් දේ අලෙවි කිරීම මගින් අනිවාර්යෙන් කිලෝ එකක් සඳහා නියමිත මුදල් හෝ මාසිකව තීරණය කරගත් මුදලක් ඉතිරි කිරීම මගින් ඉතිරි කිරීමේ පුරුද්ද වර්ධනය කිරීමට සාමාජිකත්වය පුහුණු කළ යුතුය. අනිවාර්ය තැන්පත් නියමිත ප්‍රමාණයක් දක්වා ඉතිරි කිරීම කළ හැකිය. නැතහොත් සීමාවක් නොමැතිව දිගටම ඉතිරි කළ හැකිය. මෙම මුදල් නැවත ලබා ගැනීම සාමාජිකත්වයෙන් ඉවත්වන දිනයක සිදුකළ හැකි වනසේ නීති රීති සකසා ගතයුතුව ඇත.

***සුරැකුම් පත්/ස්ථාවර තැන්පත්:***

*වෙනත් ඉතිරි කිරීම්/සාමාජික නොවන ඉතිරි කිරීම්/ළමා ඉතුරුම්:*

ඉහත කරුණ යටතේ විවිධ ඉතුරුම් මගින් සංවිධානයේ මුදල් සංචිත සංවර්ධනය කරගත හැකිය. මේ සඳහා ආකර්ශනීය පොලියක් ලබාදිය හැකිය. සංවිධානයේ ව්‍යාපාරකරණයේදී මේවා යෙදවීමෙන් ප්‍රතිලාභ ලබාගැනීමත්, ශක්තිමත් මූල්‍ය ආයතනයක් වශයෙන් පැවතීමටද හැකියාවක් ඇතිවනු ඇත. සාමාජිකයන් 150 ක් සිටින සමිතියක් සඳහා ශක්තිමත් මූල්‍ය ආයතනයක් බිහිකළ හැකිය.

## 12. නිශ්චිත අරමුණු හා කළමණාකරණය

ඉහත විස්තර කළ නිශ්චිත අරමුණු ඉටු කර ගැනීම සඳහා ප්‍රමාණවත් මඟ පෙන්වීමක් නිරන්තර සාකච්ඡාවක් ඒකාග්‍රතාවයක් පැවතීම අනිවාර්යය. මේ සඳහා අවශ්‍ය ව්‍යවස්ථාපිත නෛතික පසුබිම සකස් විය යුතුය. සමුපකාර සමිතියක් නම් සමුපකාර පණත නෛතික පසුබිම මත සකස් වී ඇත. කාරක නීති ඇති කර ගැනීම සමිතිය කළ යුතුය.

සමිතියේ කටයුතු පාලනය, කළමනාකරණය, මුදල් පාලනය, අරමුදල් ඇති කිරීම, අයකරන සේවා ගාස්තු ආදී දේ ලිඛිතව වාර්තා කළ යුතුය. මේ සඳහා අවශ්‍ය නායකත්වය තම ප්‍රදේශයේ අයගෙන්ම තෝරාගත යුතුය. එම නායකයින්, පොත් තබන්නන්, කාරක සභාව, ලේකම්, සභාපති තම තමන්ගේ කාර්යයන් පිළිබඳව අවබෝධ කර ගෙන තිබීමත් මනා පුහුණුවක් ඒ ඒ විෂයයන් පිළිබඳව ලබා ගැනීමටත් කටයුතු කළ යුතුව ඇත.

## 13. සංවර්ධන සැලැස්මක් සකස් කිරීම:

සංවිධානයේ ඉදිරි පැවැත්ම, ඉදිරි සංවර්ධනය සඳහා, සංවර්ධන සැලැස්මක් සකස්කර මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම වැදගත් කාර්යයකි. එම කාර්යය සංවිධානයේ ප්‍රගතිය මැන බලන මිම්මකි. ඒ අනුව සංවිධානයේ ප්‍රාග්ධනය සංවර්ධනය වන වේගයට සමානුපාතිකව යම් යම් ව්‍යාපාර කාර්යයන් ඉදිරියට ගෙන යා හැකිය.

පහත සඳහන් කරුණු ලැබීම් යටතේද, වියදම් යටතේද ඇතුලත් විය හැකිය.

| ලැබීම් | වියදම් |
|---|---|
| කොටස් දැනට ඇති | රබර් සඳහා ගෙවීම් |
| ඉදිරියට ලැබීමට ඇති කොටස් | රබර් ගැනුම් සඳහා |
| අනිවාර්ය තැන්පතු | ණය අත්තිකාරම් |
| වෙනත් ඉතුරුම් | ගමන් වියදම් |
| රබර් අලෙවියෙන් ලැබීම් | දිස්ත්‍රික් සංගමයේ තැන්පත් |
| ණය සඳහා පොලී ලැබීම් | කොටස් |
| වෙනත් මූල්‍ය ආයතන (දිස්ත්‍රික් සංගමය) | රසායනික ද්‍රව්‍ය ගැනුම් |
| රසායනික ද්‍රව්‍ය අලෙවියෙන් | පොහොර ගැනුම් |
| පොහොර අලෙවියෙන් | |

## 14. කෑගල්ල දිස්ත්‍රික් රබර් සමුපකාර සමිති සංගමය:

ප්‍රාථමික කුඩා රබර් ඉඩම් හිමියන්ගේ සමුපකාර සමිති සාමාජිකත්වයෙන් ගොඩ නැගෙන දිස්ත්‍රික් සංවිධානය එයයි.

එමගින් ප්‍රාථමික සමිති වලට :

1. උපදෙස් හා මඟ පෙන්වීම
2. ආයතන අතර සම්බන්ධතා ගොඩනැඟීම
3. සාමාජික තීරණ මත පොදු ප්‍රතිපත්ති හඳුනා ගැනීම
4. ප්‍රගතිය සොයා බැලීම, තොරතුරු රැස්කිරීම, ඇගයීම
5. බාහිර සම්පත් ලබාකර ගැනීමට තොරතුරු හුවමාරුව
6. සම්බන්ධීකරණය (රබර් නිෂ්පාදන අලෙවිය, ප්‍රවාහනය, වෙනත් යෙදවුම්, උපකරණ රසායනික ද්‍රව්‍ය)
7. මානවීය සංවර්ධනයට අදාළ සැපයුම්, මානසික අවශ්‍යතාවයන්, සෞන්දර්යය, ලේඛන කලාව, සංස්කෘතික අංග වලින් සම්බන්ධතා පැවැත්වීම.

සඳහා ප්‍රාථමික සමිතිවලට දායක වීමෙන් තමන්ගේ සංවිධානයේ සංවර්ධනයට මහත් ප්‍රතිලාභ ලබාගත හැකිවනු ඇත.

ප්‍රමාණවත් ග්‍රාම්‍ය නායකයින් සමිති වලින් මතුවන නායකයින්ට දිස්ත්‍රික් සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීමට අවස්ථා ලැබී ඇත. ඒ අනුව රබර් වගා කරුවන්ගේ සංවිධානයක් බිහිවීම මගින් නව නායකත්වයක් මතුකර ගැනීමට හැකියාව ලැබී තිබීම දිසාවේ රබර් වගා සංවර්ධනයටත් ඉඩම් හිමියන්ගේ හා ඒකාබද්ධ ග්‍රාම්‍ය සංවර්ධනයටත් මහත් පිටුවහලක් කරගත හැකිය.

### කළමනාකරණ ක්‍රියාවලිය

එහි මූල ධර්ම:

කළමනාකරණ ක්‍රියාවලියේ මූල ධර්ම 5ක් ඇත.

1. සැලසුම් කිරීම
2. සංවිධානය කිරීම
3. වගකීම පැවරීම අදාළ කණ්ඩායම් සඳහාය
4. මෙහෙයවීම
5. පාලනය කිරීම

මෙම කරුණු පහ ක්‍රියාත්මක වීම මත සාර්ථකත්වය රඳාපවතී. රබර සමුපකාර සමිතියක් සංවිධානයක් සඳහා සමාජ සේවා ආයතනයක් හැටියට සලකා කළමනාකරණය ක්‍රියාවට නැංවිය යුතුය.

*එහි ප්‍රධාන පරමාර්ථ*

1. සාමාජිකයන්ට ප්‍රතිලාභ ලබාදීම සේවය කිරීම
2. සාමාජිකයන්ගේ ප්‍රජා සංවර්ධනය
3. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය
4. උපරිම ලාභ ලැබීම

සේවාවන් සැලසීමට අමතරව ලාභ ලැබීම 4 වැනි පරමාර්ථය හැටියට ගත යුත්තක් වේ. එහිදී 1 හා 2 කරුණු ඉටු කිරීම සඳහා 3 අනුව පත් කරගන්නා අධ්‍යක්ෂ මණ්ඩලය (කාරක සභාව) කටයුතු කළ යුතුය. මෙම කාර්යයන් සාමාජිකත්වය තුල ව්‍යාප්ත වී සංවිධානය විනිවිද පෙනීම සඳහා කමිටු පිහිටුවීම මඟින් වඩාත් ඵලදායක ලෙස ඉටු කළ හැකිය.

පහත සඳහන් කමිටු සඳහා කාරක සභාවෙන් එක් අයෙක්ද, සාමාජිකයන්ගෙන් දෙදෙනෙක්ද, යෙදිය හැක. අවශ්‍යතා අනුව කමිටු කීපයක් ඇතිකරගත හැකිය.

1. ඉඩම් සංවර්ධන කමිටුව
2. රබර සකස් කිරීම, රැස්කිරීම, අලෙවි කිරීම කමිටු
3. සකසුරුවම් ණයගණුදෙනු කමිටුවු
4. සමාජ ආර්ථික සංවර්ධන කමිටුව
5. සුභ සාධන කමිටුව
6. විගණන (අභ්‍යන්තර) කමිටුව

**කමිටු සංවිධානය**

*එක් එක් කමිටු නිලධාරීන්ගේ කාර්ය භාරය*

යථෝක්ත 1,2,3,4,5, සහ 6 යන කරුණු සඳහා කාරක සභාවෙන් එක් කෙනෙක් හා මහා සභා රැස්වීමෙන් පත් කර ගන්නා සාමාජික මහතුන් 2 හෝ 3 න් අවශ්‍ය පරිදි යොදා ගත හැකිය.

එක් එක් කමිටුවේ කාර්ය භාරය හා ඒ ඒ සාමාජික අවශ්‍යතා අනුව කාරක සභාවේ අනුමැතිය සඳහා නිර්දේශ කිරීමට හැකිවන පරිදි කාරක නීති සකස් කරගත යුතුවේ.

රබර් ඉඩම් සංවර්ධනය යටතේ අතිරේක ආදායම් ලබා ගැනීම සඳහාද, රබර් අලෙවිය, ෂීට් නිෂ්පාදනය, පිළිබඳව ද උපරිම මිලක් ලබාදීම පිළිබඳව ද සාමාජික අවශ්‍යතා අනුව අත්තිකාරම් ණය ලබා ගැනීම, අරමුදල් සංවර්ධනය කිරීම ආදී කටයුතු වලදී කාරක සභාවට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමට හැකිවේ.

තවද සාමාජිකයාගේ සමාජ ආර්ථික මානව සංවර්ධනය සඳහා තොරතුරු සමීක්ෂණයෙන් ලත් දත්ත අනුව යම් යම් ක්‍රියාකාරකම් සඳහා මුදල් ලබාදීමට නිර්දේශ කිරීමත්, ඒ ඒ කමිටු වල කාර්ය භාරය ලෙස පෙන්වා දිය හැකිය.

සමිතියේ සමස්ත මූල්‍ය කටයුතු අභ්‍යන්තර විගණන කමිටුවක් මඟින් පරීක්ෂාවට භාජනය කළ යුතුය. සෑම මසකම මුදල් සාරාංශයක් අදාල ගිණුම් වල නිවැරදි භාවයක් පිළිබඳව මහා සභාව දැනුවත් කිරීම ගිණුම් කමිටුවේ කාර්ය භාරය වේ. මෙවන් කමිටු සංවිධානයක් පවත්වා ගෙන යෑම තුලින් සමිතියේ ක්‍රියාකාරීත්වය ශක්තිමත්ව දිගු කාලීනව පවත්වා ගෙන යා හැකිය. පසු විපරම් කිරීම, අඩුපාඩු සොයා බැලීම, ක්‍රියාකාරීත්වය ඇගයීම, තීරණ ක්‍රියාවට නැංවීම යන කරුණු වලදී ජනතාවගේ දැනුවත් බව වැඩි කිරීමටත්, නිතර සොයා බැලීමටත්, යොමුවන ප්‍රවනතාවයක් දැකිය හැකිවනු ඇත.

යථෝක්ත සමස්ත වැඩ සටහන ක්‍රියාවට නැංවීම තුලින් ග්‍රාමීය සංවර්ධනයේ අරමුණු, ඉලක්ක සාර්ථක කර ගැනීමට මහත් උපකාරයක් වනු නොඅනුමානය.

## රබර් සමුපකාර සමිතිවල නායකත්වය කළමණාකරණය හා ව්‍යාපාරික භූමිකාව

රබර් සමුපකාර සමිතියක් හෝ වෙනත් කෘෂි සමුපකාර සමිතියක් සෑම විටම නිරන්තර පුහුණුවකට යටත්වූ ක්‍රියාකාරී මණ්ඩලයක් හා නායකත්වය අත්‍යාවශ්‍ය සාධකයක් වේ. එම නායකත්වය, ක්‍රියාකාරී මණ්ඩලය සාමාජික අවශ්‍යතා මැනවින් හඳුනාගත් සජීවී ක්‍රියාකාරී නායකයෝ විය යුතුය. විසිඑක්වැනි (21) සිය වසට ගමන් ගන්නා නායකත්වයක් විය යුතුය.

සාමාජික අවශ්‍යතා හඳුනා ගැනීම කළමණාකරනය, නායකත්වය පිළිබඳව විධිමත් පුහුණුවක් ලබා තිබීම ඉතා වැදගත් පුහුණු අවශ්‍යතා හඳුනාගෙන එම පුහුණුව සාමාජිකත්වයද,

කාරක සභාවට ලබාදීම වැදගත්වේ. එවැනි නායකයන් සතුවිය යුතු ගුණාංග වශයෙන් පහත සඳහන් කුසලතා දැක්විය හැකිය.

1. සංකල්පිත කුසලතා
2. මානව කුසලතා
3. තාක්ෂණික කුසලතා
4. කළමණාකරණ කුසලතා
5. තීරණ ගැනීමේ කුසලතා

තවද ක්‍රියාත්මක කිරීමට අදහස් කරන ව්‍යාපෘති සංවර්ධන සැලසුම් කිරීම නිර්මානාත්මක විය යුතුය.

එම නිර්මානාත්මක බව -

1. පැහැදිලි විය යුතුය
2. ස්ථිර විය යුතුය
3. සංශිප්ත විය යුතුය
4. සම්පූර්ණ විය යුතුය
5. විනීත විය යුතුය

**කෘෂි සමුපකාර සංවිධානයක නායකත්වයේ, කළමණාකරුවාගේ භූමිකාව**

හෙන්රි මින්ට්ස් බර්ග් විසින් කරන ලද අධ්‍යයනයක් ඇසුරෙන් නායකයෙක්, කළමණාකරුවෙක් සතු ප්‍රධාන භූමිකා දහයක් හඳුනාගෙන ඇත.

*1. අන්තර් පුද්ගල සබඳතා භූමිකාව තුල*

1. නාමික නායකත්වය භූමිකාවක්,
11. නායකත්ව භූමිකාවක්
111. සබඳතා භූමිකාවක් මේ යටතේ ගැනෙයි.

උපරිම වශයෙන් තොරතුරු රැස්කර ගැනීමට අන්තර් පුද්ගල සබඳතා භූමිකා උපකාර් වේ.

*2. තොරතුරු භූමිකාව තුල*

iv. තොරතුරු ලබා ගැනීම. තොරතුරු පෙරීමද.

v. තොරතුරු බෙදා හැරීම

vi. ප්‍රකාශනය මේ යටතට ගැනේ.

*3. තීරණ භූමිකාව තුල*

මේ යටතේ vii. ව්‍යවසාදායකත්වය

vii. ගැටළු නිවාරණය

ix. සම්පත් බෙදා හැරීම

x. විසඳුම් ඇති කිරීම මේ යටතේ ගැනේ.

සංවිධානය තුල

1. විනිවිද පෙනෙන ගිණුම් ක්‍රමයක් පවත්වාගෙන යෑමත්

2. වාර්ෂිකව ඉදිරිපත් කරණ සංවර්ධන සැලැස්ම ශේෂ පත්‍රයක් ලාභ අලාභ ගිණුමක් ප්‍රාග්ධන ගිණුමක් වශයෙන් සංඛ්‍යා ලේඛණ මගින් ඉදිරිපත් කිරීමට දැණුවත් භාවය. පුහුණුව ලබා ගත යුතුය.

එම පුහුණු අවශ්‍යතා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවද. ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයෙන්ද කළුතර දිස්ත්‍රික් රබර් සංගමය මගින්ද ලබාගත හැකිය.

**දක්ෂ නායකත්වය, කළමණාකරුවා**

පුද්ගලයන් පුබුදු කරයි.

තම යටත් නිලධාර්න්. සම නිලධාර්න් තම සේවය ලබා ගන්නන් මෙන්ම තම උසස් නිලධාර්න්ද පුබුදු කරයි.

ඔහු/ඇය

තමාවෙත පුද්ගලයන්ගේ අවධානය ගැනීමට උත්සාහ නොකරයි.

අනුන්ගේ අවධානය නිතැතින්ම ඔහු වෙත ඇදී එයි. අනිකුත් අය කාර්යක්ෂම ලෙස රාජකාරියේ, සේවයේ සමත්වන අභ්‍යන්තර බලවේගයන් ඔහු/ඇය සතුව ඇත. අන් අයතුල තම දරශනය ජවත් කරවන්ට තමා අදහන දේ අන් අයගේ කරවන්නට තරම් ඔහු/ඇය සමත් වෙයි.

ඉතා සංකීර්ණ අදහස් පවා සරලව ඉදිරිපත් කරවන්නට ඔහු/ඇය සමත්වෙයි.

යථෝක්ත පරිදි පුද්ගලයන් සකස්වීම මේ සඳහා අවශ්‍ය නිපුනතා හෙවත් ගුනාංග නායකත්ව පුද්ගලයා වෙත තිබිය යුතුය.

1. චිත්ත වේග පරිනත භාවය
2. න්‍යාය පිළිබඳ දැනුම - වෙළඳපොල ක්‍රියාත්මක වන ආකාරය
3. අරමුණු/ඉලක්ක දක්වා යෑම සඳහා වූ පැහැදිලි ස්ථිර අධ්‍යයනය
4. සන්නිවේදන කුසලතා
5. සුභවාදී ආකල්ප

මෙම නිපුනතා පුහුණු කිරම සඳහා යොදාගත හැකි පුහුණු ක්‍රමද පහත දැක්වේ.

සිද්ධීන් විශ්ලේෂණය

ව්‍යුහගත අභ්‍යාස

භූමිකා රංගනය

ක්ෂණික භූමිකා රංගනය

රූප භාවනාව

සංවිධානයක නායකත්වය ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටු කිරමට බැඳී ඇති බව මෙහි අවසන් වශයෙන් අවධාරණය කළ යුතුය.